3 වන පිටෙන්

රටක් ලෙස, ජනතාවක් ලෙස අප මුහුණදී සිටින සැබෑ අර්බුදයන්ට, අභියෝගයන්ට විසඳුම් සෙවීම සඳහා පීඩාවට පත් සියලු ජනයා සමගියෙන් කටයුතු කළ යුතු මොහොතක කුමන හෝ හේතුවක් මත ජනතාව අතර භේද හා ගැටුම් නිර්මාණය වන්නේනම්, එවැනි ගැටුම් හෝ භේද නිර්මාණය කිරීම සඳහා කුමන හෝ පාර්ශ්වයකින් කවුරුන් හෝ කටයුතු කරන්නේනම් එය මුළු සමාජයටම ඉතාම හානිකර වනු ඇත.

අපේ රටේ දශක ගණනාවක් තිස්සේ බලය ලබාගැනීම හා බලය පවත්වා ගැනීම වෙනුවෙන් සිංහල*දෙමළ ජාතිවාදය



ඇවිස්සීමත්, ජාතිවාදී ගැටුම් හා කෝලාහල විටින් විට නිර්මාණය කිරීමත් නිසා අවසානයේ ජාතිවාදී හා බෙදුම්වාදී යුද්ධයකට පාර කැපුණ ආකාරය අප කිසිවෙකුටත් අමතක විය යුතු නැත. වසර 30කට වැඩි කලක් පැවති එම බෙදුම්වාදී යුද්ධයෙන් පීඩාවට පත්වූයේ තම බලය වෙනුවෙන් ජාතිවාදය වැපිරූ අය නොව සිංහල, දෙමළ, මුස්ලිම් සියලු පොදු ජනතාවය. එම බෙදුම්වාදී යුද්ධයෙන් මිනිස් ජීවිත දහස් ගණනක් අහිමි වූ අතර විනාශ වූ දේපළ ප්‍රමාණය ගණන් බැලිය නොහැකි තරම්ය. එම බෙදුම්වාදී යුද්ධය ලංකාවේ අභ්‍යන්තර ප්‍රශ්නවලට මැදිහත්වීමට ඉන්දියාවත් අධිරාජ්‍යවාදී විදේශ බලවේග හා රාජ්‍යයනුත් යොදාගත් හැටි කිසිවෙකුට රහසක් නොවේ. විටෙක ඉන්දියානු හමුදා ආක්‍රමණයක් පවා සිදුවීමට එය හේතුවිය. වර්තමානයේදීත් අධිරාජ්‍යවාදී බලවේග ලංකාවට එරෙහිව මැදිහත් වීමට යොදාගනිමින් තිබෙන්නේ එම බෙදුම්වාදී යුද්ධයේ සිදුවීම්ය.

එවැනි ඛේදවාචකයකට මුහුණ දී එහි විනාශකාරී අත්දැකීම් සහිතව සිටින ජනතාවක් ලෙස යළිත් එවැනිම වූ ගැටුමකට ඉඩ නොදීම අප කාගේත් වගකීමය. ජාතිවාදය වැපිරීම නිසා නිර්මාණය වූ බෙදුම්වාදී යුද්ධයක අමිහිරි මතකය මැකී යාමටත් පෙර නැවත ජාතිවාදී හෝ ආගම්වාදී ගැටුමක් රට තුළ මතුවන්නේ නම් එය ඉතාම විනාශකාරී ප්‍රතිඵල ගෙනදෙනු ඇත. කුමන වර්ගයේ ආගමික අන්තවාදයකට හෝ මූලධර්මවාදයකට ඉඩ නොතැබීමට සියලුම ආගම් අදහන ජනතාව වග බලාගත යුත්තේ ඒ නිසාය. ජනතාව අතර සමගිය බිඳින, ගැටුම් හා කෝලාහල නිර්මාණය වීමට ඉඩ සලසන ආගමික හෝ වෙනත් ඕනෑම ප්‍රතිවිරෝධයකින් වාසි ලබාගන්නේ අධිරාජ්‍යවාදී විදෙස් බලවේග, ප්‍රතිගාමී බලවේග, මිස ජනතාව පෙළන පාලක කණ්ඩායම් මිස අන් කවරෙක්වත් නොවේ.

මෑත කාලයේ ලෝකය පුරා බොහෝ සිදුවීම් කියා පාන්නේ ආගමික, ජාතිවාදී හෝ මූලධර්මවාදී ක්‍රියා කිසිසේත් මෙම ආගමට හෝ ජාතියට කිසිදු වැඩදායී කාර්යයක් ඉටුකොට නොමැති බවයි. මෑත කාලයේ මුස්ලිම් මූලධර්මවාදීන් විසින් ඇෆ්ගනිස්ථානයේ ඓතිහාසික බාමින් බුදු පිළිම විනාශ කිරීමෙන්ද බුරුමයේ බෞද්ධ ආගම මුවාවෙන් සිදුවන ප්‍රචණ්ඩ ක්‍රියා මගින්ද හින්දු ආගමික මූලධර්මවාදීන් විසින් අයෝධ්‍යා මුස්ලිම් පල්ලි විනාශ කිරීමෙන්ද බංගලාදේශයේ බෞද්ධාගමට එරෙහිව සිදුවන ප්‍රචණ්ඩ ක්‍රියා මගින්ද එම ජාතීන්ට හෝ ආගම් ලබ්ධිකයින්ට එම ක්‍රියා මගින් සිදුව ඇත්තේ අප්‍රසාදය හා දැඩි පිළිකුළයි.

එහෙයින් අප ඉදිරියේ ඇති මෙම සැබෑ ප්‍රශ්න හඳුනාගෙන ඒවා පරාජය කරනවා වෙනුවට ඒවා දෙස නොබලා විවිධ ආගම් අතර හෝ ජන කණ්ඩායම් අතර භේද නිර්මාණය වන ලෙස, ගැටුම් නිර්මාණය වන ලෙස කවුරුන් හෝ කටයුතු කරන්නේනම් එය වාසි වන්නේ ජනතාවට නොව ප්‍රතිගාමිත්වයටය. ඉන් සැබෑ ප්‍රශ්න අමතක කරවීම හා ඒවායේ සැබෑ වගඋත්තරකරුවන් ආරක්ෂා කිරීමද සිදුවේ.

එබැවින් ජනතාව අතර සමගිය බිඳින, ආගම්වාදී හෝ ජාතිවාදී ගැටුම්වලට හා කෝලාහලවලට මග සලසන, අධිරාජ්‍යවාදී බලවේගවලට හා ප්‍රතිගාමීත්වයට වාසි සලසන කුමන හෝ වර්ගයක ආගම්වාදී, ජාතිවාදී අන්තවාදයන්ට ගොදුරු නොවීමටත් ඒවා පරාජය කරමින් සියලු ජනතාව අතර සමගිය ගොඩනැගීමටත් අප කටයුතු කළ යුතුය.

දශක 3කට වැඩි ජාතිවාදී බෙදුම්වාදී යුද්ධයකින් බැටකා සිටින ජනතාවක් ලෙස තවත් එවැනිම ආගම්වාදී ගැටුමකට ඉඩ නොතබා, හැඟීම්බරව නොව බුද්ධියෙන් කල්පනා කරමින්, ජනතාව මුහුණ දෙන සැබෑ අභියෝග හඳුනාගෙන ඒවා ජයගැනීම සඳහාත් ඒ වෙනුවෙන්ම ජනතාව අතර සමගිය ගොඩනැගීම සඳහාත් සක්‍රියව දායකවීම සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ සහ බෞද්ධ, හින්දු,ඉස්ලාම්, ක්‍රිස්තියානි, කතෝලික ඇතුළු සියලුම ශ්‍රී ලාංකේය ජනතාවගෙ වගකීමක් වනු ඇත.

මෙම තත්වය පිළිබඳව පැන නගින පහත ප්‍රශ්න කෙරෙහි ගරු ඇමතිතුමා වෙත යොමු කරමි.

01. කවර ආගමකින් හෝ වර්ධනය වෙමින් පවතින ආගමික අන්තවාදයන් හා මූලධර්මවාදී ක්‍රියා ආණ්ඩුව හඳුනාගෙන තිබේද?

02. එවැනි ක්‍රියාවන් මැඩ පැවැත්වීම වෙනුවෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද?

## සන්නස Cartoon by PK










PK ගේ කාටූන් රසවිඳින්නට දිනපතා www.sannasa.net අඩවියට ගොඩවන්න

සන්නස වෙළඳ දැන්වීම් සඳහා විමසන්න
03 8707 4604 / 0402 025 516
email sannasanews@gmail.com ads.sannasa@gmail.com